දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NA/06/T/23/2018/වං.ස්.මං
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2021.04. 05
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதாரஅமைச்சு
# Ministry of Health

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් , ශ්‍රී ලංකා ජාතික රෝහල.
ජාතික රෝහල්/ශික්ෂණ රෝහල්/මහ රෝහල් /අධ්‍යක්ෂවරුන් හා
මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරීන් ,
ඇතුළු සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

**හෙද/හෙදි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2018/2019**

හෙද/හෙදි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ලබා දීමට අදාළව නිකුත් කරන ලද අංක **02-72/2019** හා **2019.05.07** දිනැති ස්ථාන මාරු චක්‍රලේඛය හා 2020.05.21 දිනැතිව වෙබ් අඩවියේ පළ කරන ලද ස්ථාන මාරු නියෝග ඇතුළත් ලේඛනය හා බැඳේ.

02. ඒ අනුව, එම ස්ථාන මාරු නියෝග වලින් 2015 බී සිසු හෙද කණ්ඩායමෙන් හා 2015 බී පළමු අතිරේක කණ්ඩායමෙන් අනුප්‍රාප්තිකයන් ලබා දී, මෙතෙක් එම ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක නොවූ නිලධාරීන්ගේ ස්ථාන මාරු නියෝග හැර අනෙකුත් සියලුම ස්ථාන මාරු නියෝග මින් අවලංගු කරමි.

03. කොවිඩ්-19 තත්ත්වය හේතුවෙන් 2016 සිසු හෙද කණ්ඩායම පුහුණුව අවසන් කිරීමට ප්‍රමාද වීම නිසා ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා අනුප්‍රාප්තිකයන් ලබා දීමට ප්‍රමාද වූ බැවින්, ස්ථානමාරු නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා මෙසේ අනුප්‍රාප්තිකයන් ලබා දී නොමැති නිලධාරීන්ගෙන් 2020.11.06 දිනැතිව දැනට පවතින ස්ථාන මාරු සංශෝධනය කර ගැනීමේ අවශ්‍යතාවය පවතින නිලධාරීන්ට ඒ සඳහා අභියාචනා කිරීමේ අවස්ථාව සලසා දෙන ලදී.

04. ඒ අනුව එම ඉල්ලීම්ද ඇතුළත්ව සකස් කරන ලද ස්ථාන මාරු ලේඛනය අභියාචනා මණ්ඩලය හරහා 2020.12.31 දිනට මධ්‍යම රජයේ හා පළාත් සභා රෝහල්වල පැවති පුරප්පාඩු ද සළකා බලා ස්ථාන මාරු නිර්දේශ ලබා ඇති නිලධාරීන්ගේ නාම ලේඛනය මේ සමඟ වේ.

05. මෙහිදී 2019.05.24 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර 04ක සේවා කාලයක් සපුරා ඇති මධ්‍යම රජයට අයත් රෝහල් සහ පළාත් සභා රෝහල්වල සේවය කරන නිලධාරීන්ට ද අපේක්ෂා රෝහල, අංගොඩ මූලික රෝහල , ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය හා වැලිසර ළය රෝහල යන සේවා ස්ථාන වල 2019.05.24 දිනට වසර දෙක(02)ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ට, ඔවුන් වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය අනුව ජ්‍යෙෂ්ඨතාවය සලකා බලා ස්ථාන මාරු නිර්දේශ ලබාදෙන ලදී.

06. මෙම ස්ථාන මාරු ලේඛනයේ නිර්දේශය යන තීරුව යටතේ **"<u>නිර්දේශ කරමු</u>"** ලෙස සඳහන් කර ඇත්තේ ස්ථාන මාරු ලබා දීමට ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශය ලැබී ඇති නිලධාරීන්ට වන අතර **"<u>පළාත් අනුමැතියට යටත්ව නිර්දේශ කරමු</u>"** ලෙස සඳහන් ව ඇති නිලධාරීන් සඳහා පළාත් එකඟතාව ලද පසු අදාළ නිලධාරීන් පළාත් සභා වෙත ස්ථිරව මුදා හැරීමට නියමිතය.එසේම පළාත් අනුමැතිය නොලැබුණහොත් එම ස්ථාන මාරුව අවලංගු කිරීමට සිදුවන බව කාරුණිකව දන්වමි.

07. මෙහි දී සේවා කාලය පිළිබඳ තොරතුරු ලබා ගන්නා ලද්දේ අදාළ නිලධාරීන්ගේ ස්ථාන මාරු අයදුම්පත්වලින් වන බැවින් එම අයදුම්පත්වල සඳහන් තොරතුරු ව්‍යාජ/අසත්‍ය බව හෙළිදරව් වුවහොත් එම තොරතුරු සපයන ලද නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන බවට දන්වා සිටින අතර, එවැනි වැරදි තොරතුරු මත ලබා දෙන ස්ථාන මාරු අවලංගු කිරීමට ද කටයුතු කෙරේ. එවැනි තොරතුරු මත ස්ථාන මාරු අයදුම්පත් සහතික කළ නිලධාරීන් ඒ සඳහා වගකිව යුතු වේ.

08. රෝහල්වල සේවා සැපයීම අඩාල නොවන සේ ස්ථානමාරුවීම් / පළාත් රාජ්‍ය සේවය සඳහා ස්ථිරවම නිලධාරීන් මුදා හැරීම් සිදු කළ යුතු අතර ආයතනයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියාට ප්‍රමුඛතාව ලැබෙන ආකාරයෙන් සේවා ස්ථානයෙන් නිදහස් කිරීම යෝග්‍ය වේ. ආයතනයන්ට අදාළ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා දී ඇති සංඛ්‍යාවට අනුකූලව ඔබ ආයතනයේ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යන ලෙස ද මෙයින් ඔබට දැනුම් දෙනු ලැබේ.

09. අදාළ අභියාචනා /විරෝධතා හා නිවැරදි කිරීම් සම්බන්ධව ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ නිර්දේශයද සැළකිල්ලට ගෙන ස්ථාන මාරු නියෝග අඩංගු ලේඛනය සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි **(www.health.gov.lk)** පළ කරනු ලබන අතර, ස්ථාන මාරු සම්බන්ධ තීරණය පෞද්ගලිකව කිසිම නිලධාරියකුට දැනුම් දෙනු නොලැබේ. මේ සම්බන්ධව ඔබ ආයතනයේ සියළුම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

10. මෙම ස්ථාන මාරු නියෝග 2021.04.06 දින සිට බලාත්මක වේ.

ජී.එම්.කේ.කේ.අත්තනායක,
අතිරේක ලේකම්(පාලන) II,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

ජී. එම්. කේ. කේ. අත්තනායක
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.